පොදු චක්‍රලේඛ අංකය : 01 - 11 / 2017

මගේ අංකය : DDG/DS/28/17

සෞඛ්‍ය,පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය,
සුවසිරිපාය, 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

2017.02. 06

සියළුම පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්
සියළුම ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්
ප්‍රාදේශීය දන්ත ශල්‍ය වෛද්‍යවරුන්
ශික්ෂණ රෝහල් අධ්‍යක්ෂවරුන් සහ
ආයතන ප්‍රධානීන්

<u>ලෝක මුඛ සෞඛ්‍ය දිනය - 2017 මාර්තු 20</u>

<u>"පිරිපුන් දිවියකට සුපසන් මුවක්"</u>

ජාත්‍යන්තර දන්ත වෛද්‍ය සම්මේලනය විසින් 2017 මාර්තු 20 දිනය ලෝක මුඛ සෞඛ්‍ය දිනය ලෙස ප්‍රකාශයට පත්කර ඇත. 2017 වසර සඳහා තේමාව පිරිපුන් දිවියකට සුපසන් මුවක් යන්නයි. සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය හා ශ්‍රී ලංකා දන්ත වෛද්‍ය සංගමය එක්ව ලෝක මුඛ සෞඛ්‍ය දිනය සැමරීමේ ජාතික වැඩසටහන 2017 මාර්තු 20 දින රත්නපුර දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කොට්ඨාශයේදී ගරු සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍ය ගරු රාජිත සේනාරත්න මැතිතුමන්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්වීමට සැලසුම් කර ඇත.

මෙහිදී 2017 ලෝක මුඛ සෞඛ්‍ය දිනය සැමරීම සඳහා "පිරිපුන් දිවියකට සුපසන් මුවක්" යන තේමාව මුල්කර ගනිමින් වැඩසටහන් සැලසුම් කර ක්‍රියාත්මක කල යුතුය.

ජාත්‍යන්තර දන්ත වෛද්‍ය සම්මේලනය දන්වා ඇති පරිදි මෙම වසරේ සැමරුම්වලදී අවධානය යොමු කළ යුතු ප්‍රධාන ක්ෂේත්‍ර කිපයකි. FDI විසින් යෝජනා කර ඇති ප්‍රධාන ක්ෂේත්‍ර අතරින්, ශ්‍රී ලංකාවේ ජනගහනයට අදාළ වන ප්‍රධාන ක්ෂේත්‍ර 2ක් සෞඛ්‍ය අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකා දන්ත වෛද්‍ය සංගමය විසින් හඳුනාගෙන ඇත.

01. පෙර පාසැල් හා පාසැල් දරුවන්ගේ මුඛ සනීපාරක්ෂාව වර්ධනය කිරීම.

02. දුම්කොළ ආශ්‍රිත නිශ්පාදන භාවිතය පිළබඳ විශේෂ අවධානය යොමුකරමින් තරුණ-තරුණියන්, වැඩිහිටියන් සහ විශේෂ අවදානම් කණ්ඩායම් අතර මත්ද්‍රව්‍ය සහ දුම්කොළ භාවිතය වැලැක්වීම

## යෝජිත ඉලක්කගත කණ්ඩායම් වන්නේ

01. පෙර පාසැල් / පාසැල් දරුවන් / පාසැල් හැර යන්නන් / තරුණ- තරුණියන්
02. දුම්කොළ ආශ්‍රිත නිශ්පාදන භාවිතය සඳහා වැඩි අවදානමක් ඇති විශේෂ කණ්ඩායම් - තේ සහ රබර් වතු සේවකයින්, මැණික් පතල් සේවකයින්, බස් සහ ත්‍රී රෝද රථ රියදුරන්

එම වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී,

01. 2017 මාර්තු 17 සිට ඉදිරි මාසයක කාලසීමාවක් තුළ ලෝක මුඛ සෞඛ්‍ය දිනය වෙනුවෙන් අදාළ තේමාව හා සබැඳි විවිධ ක්‍රියාකාරකම් සැලසුම් කර ක්‍රියාත්මක කල යුතුය.
02. ප්‍රාදේශීය දන්ත ශල්‍ය වෛද්‍යවරුන් අවශ්‍ය උපදෙස් ලබාගැනීම සඳහා අදාළ සියළුම සම්පත්ධාරීන් සමග සම්බන්ධීකරණය කල යුතුය.
03. සියළුම ආයතන ප්‍රධානීන් මෙම වැඩසටහන් සඳහා සෞඛ්‍ය සේවා කාර්ය මණ්ඩල සක්‍රියව සහභාගි කර ගැනීමට වගබලා ගත යුතුය.

## 2017 ලෝක මුඛ සෞඛ්‍ය දිනය සඳහා යෝජිත ක්‍රියාකරකම්

01. ලෝක මුඛ සෞඛ්‍ය දිනය සහ එහි තේමාව සඳහා මාධ්‍ය ආවරණය - ජාතික සහ ප්‍රාදේශීය මට්ටමින්
02. බැනර් - 2017 ලෝක මුඛ සෞඛ්‍ය දින තේමාව අඩංගු බැනර් සෞඛ්‍ය ආයතනවල ප්‍රදර්ශනය කිරීම.
03. සියළුම දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි මාර්තු මාසය පුරා පෙර පාසැල් දරුවන්ගේ මුඛ සනීපාරක්ෂාව වර්ධනය අරමුණු කරගත් ක්‍රියාකාරකම්.
    - පෙර පාසැල් ගුරුවරුන් සඳහා පුහුණු වැඩසටහන්
    - අධ්‍යාපනික ද්‍රව්‍ය බෙදාහැරීම උදා:- මුඛ සෞඛ්‍ය පිළිබඳ අත්පත්‍රිකා, පෝස්ටර්
04. මත්ද්‍රව්‍ය සහ දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදන භාවිතය සීමා කිරීමට සියලුම දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි මාර්තු මාසය පුරා සිදු කිරීම සඳහා ක්‍රියාකාරකම්.
    - සෞඛ්‍ය සේවා කාර්ය මණ්ඩලයේ හැකියා වර්ධනය
    - පාසැල් සෞඛ්‍ය නායකයින් සඳහා වැඩසටහන
    - පාසැල් හැර යන්නන් සඳහා වැඩසටහන තරුණ සංගම්, යොවුන් සේනාංකය සහ තරුණ පුහුණු මධ්‍යස්ථානවල වැඩසටහන් පැවැත්වීම
    - බස් රථ රියදුරන් සහ ත්‍රී රෝද රථ රියදුරන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් සහ ඉන් මුදා ගැනීමේ වැඩසටහන්
    - ආගමික නායකයින් සඳහා ඒ පිළිබඳ උපදෙස් ලබා දීමේ වැඩසටහන්
    - දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදන භාවිතය පිළිබඳ නියාමයන් ක්‍රියාත්මක කිරීම සඳහා මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයන් හා පොලිස් නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන
05. 2017 මාර්තු 20 දින ලෝක මුඛ සෞඛ්‍ය දින වැඩසටහන

ප්‍රධාන වැඩසටහන ගරු සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍ය රාජිත සේනාරත්න මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් රත්නපුරේදී පැවැත්වෙනු ඇත.

ඉහත සඳහන් ක්‍රියාකාරකම්වලට අමතරව ඕනෑම මුඛ සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහනක් ඔබ ප්‍රදේශයේ සංවිධානය කළ හැකිය.

රෝහල් සෞඛ්‍ය අධ්‍යාපන ඒකක මෙම කාලය තුළ සියලුම මුඛ සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන්වල ක්‍රියාකාරි ලෙස නිරතවන බවට ආයතන ප්‍රධානියා වග බලාගත යුතුය. ක්ෂේත්‍රය තුළ සිදු කරන වැඩසටහන සඳහා ප්‍රාදේශීය දන්ත ශල්‍ය වෛද්‍යවරුන් සහ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන් මග පෙන්විය යුතු අතර සෞඛ්‍ය අධ්‍යාපන නිලධාරීන් විසින් එය සම්බන්ධීකරණය කළ යුතුය.

මුඛ සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන් සඳහා ක්‍රියාකාරි ලෙස දායකත්වය ලබා දෙන ලෙස සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලවලට අනුයුක්ත සියලුම මහජන සෞඛ්‍ය කාර්ය මණ්ඩලයට උපදෙස් දෙනු ලැබේ.

ලෝක මුඛ සෞඛ්‍ය දිනය සැමරීම සඳහා මාසය පුරා සිදු කරන සියලුම ක්‍රියාකාරකම් වල කාර්ය සාධන වාර්තා නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (දන්ත සේවා) කාර්යාලය, සෞඛ්‍ය අමාත්‍යාංශය කොළඹ 10 වෙත පිටපතක් සහිතව අදාළ ප්‍රාදේශීය දන්ත ශල්‍ය වෛද්‍යවරුන් වෙත යොමු කළ යුතුය.

වෛද්‍ය ජේ.එම්.ඩබ්. ජයසුන්දර බණ්ඩාර
වැ.බ. සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්